# දේශද්‍රෝහීන් හඳුනාගනිමු!

**ව**සර විසි හයක් පුරා පැවතුණු දෙමළ කොටි ත්‍රස්තවාදී කුරිරු යුද්ධය අවසන් වීම ගැන බහුතර ශ්‍රීලංකාවාසීන් සංතෝෂ වන, සැනසුම් සුසුම් හෙලන මේ අවස්ථාවේ එසේ නොදැනෙන අයත් අප ලංකාවේ සිටින්නට හැකි බව දැන් අපට පැහැදිලිය. මේ ම්ලේච්ඡ යුද්ධය මෙතුවක් දිග්ගැස්සෙමින් ඇදි ඇදී ආවේත්, එය නිමාවක් දකිනු නැතැයි යන අදහස අප බොහෝ දෙනෙකු තුළ මතුවුනේත් මෙම කොටි ත්‍රස්තවාදයේ සංකීර්ණ ස්වභාවය නිසා ය. එම ස්වභාවය ඉබේ ඇතිවූවක් නොව එය කොටි විසින්ම හිතා මතා ඇතිකරන ලද්දකි. ඒ හේතුවෙන් කොටින්ගේ ක්‍රියා කලාපය සාධාරණ දෙයක් ය යන අදහස සමහර සිංහළයෝ සිතට වද්දා ගත්හ.

ප්‍රභාකරන් දන්නා මාක්ස්වාදයක් නැතිවුනත් කොටි සංවිධානය මුල් යුගයේ සිට පිටතට පෑ ඉඟිය නම් තම සංවිධානය මාක්ස්වාදී සංවිධානයක් බවයි. එහි නායක ප්‍රභාකරන්ද මාක්ස් වාදියෙකු බවයි. මේනිසා සාමාන්‍යයෙන් කෙරෙන්නාක් මෙන් කොටි සංවිධානය ගැන සානුකම්පික ඇසෙන් මුලදී බලන්නට පටන්ගත්තේ ලංකාවේ සමසමජ පක්ෂය ඇතුළු මාක්ස්වාදී පක්ෂයි. එහෙත් කොටියන් මොන මාක්ස්වාදීන් වත් නොව අමුම අමු මිනීමරුවන් බව නොබෝ කලකින්ම පැහැදිලි වීය.

ත්‍රස්තවාදීන් හෝ නිදහස් අරගලවාදීන් හෝ මුලදී රහසිගතව ඉතා නිශ්ශබ්දව කසුකුසු ගෑමෙන් පමණක් අටවාගන්නා සංවිධාන පසු කලෙක කල එළියේ ප්‍රසිද්ධියක් ඇතුව ක්‍රියා කරන්නට පටන්ගන්නේය. කල්යත්ම ජනතාව අතර ප්‍රචලිත වීමට ඔවුන්ට ප්‍රසිද්ධිය අවශ්‍ය වන්නේය. ඒ ප්‍රසිද්ධිය තම පළාතෙන් ඔබ්බට ගොස් මුළු රට පුරාමද, ඉනුත් ඈතට විදේශ රටවල් කරාද යොමු කිරීමට වර්තමානයේ අරගලවාදී කණ්ඩායම්වල අරමුණයි. සෑම රටකම පාහේ තමවර්ගයා පදිංචිව සිටින නිසා ඒ අයට තම අරගලය පිළිබඳ පණිවුඩ යැවීම අරමුදල් එකතුකර ගැන්මට ප්‍රයෝජන වත් වෙයි.

එල්ටීටීඊ සංවිධානය මේ පිළිවෙත මුලසිටම අනුගමනය කළේය. ඒ නිසා ඔවුන්ට යුරෝපය ඇතුළු බොහෝ විදේශීය රටවල අනුගාමිකයින් අනුග්‍රාහකයින් දහස් ගණනක් ඇතිකරගන්නට හැකිවිය. ඩොලර් බිලියනයක විශාල අරමුදලක් කොටි සංවිධානය සතුව ඇති බව කියති.

මීට අමතරව ශ්‍රීලංකාව ඇතුළතද තම ව්‍යාපාරය දරුණු ලෙසම කරගෙන යාමට ඔවුන්ට හැකිවිය. මිනිස් ඝාතනයන් කරන අතරේම රජයේත් විපක්ෂයේත් තමන්ට අවනත අය පිරිසක් ඇතිකර ගන්නට එල්ටීටීඊයට හැකිවිය. ඔවුන් ඉහළපෙලේ අය වෙත, ව්‍යාපාරිකයන් වෙත කිට්ටු වුනේ කොළඹ වාසය කරන ද්‍රවිඩ සංධාන මන්ත්‍රීවරුන්ගේ මාර්ගයෙනි. තාක්ෂණය දියුණු වෙත්ම මෙය තවත් පහසු විය. බොහෝ ගනුදෙනු සිදුවුණේ මොබයිල් පෝන් මාර්ගයෙනි.

එල්ටීටීඊ ශ්‍රීලංකාවේ ඉලෙක්ට්‍රොනික් හා මුද්‍රිත මාධ්‍යයටද කිට්ටු විය. සිංහළ මාධ්‍ය ජාලය හා සම්බන්ධ වුණේ ද්‍රවිඩ මාධ්‍යකරුවන්ගේ මාර්ගයෙනි. එම ද්‍රවිඩ මාධ්‍යකරුවෝ පුවත් පත් සාකච්ඡාවලට නිතර සහභාගිවීම හේතුවෙන් සිංහළ මාධ්‍යවේදීන් හඳුනාගෙන මිත්‍රත්වයක් ගොඩනගාගෙන සිටියහ. කොළඹ ඇතැම් මාධ්‍ය සංවිධාන රජය උතුරේ ගෙනයන ත්‍රස්ත මර්ධන ක්‍රියාවන්හි දී උතුරේ සාමාන්‍ය දෙමළ වැසියන්ට හා එහි මාධ්‍යකරුවන්ට හිරිහැර වන බවට කෑකෝගසමින් කොළඹ ලිප්ටන් වටරවුමේ සිට උද්ඝෝෂණ ව්‍යාපාර දියත් කළේ මෙම කොටි හිතවාදී සිංහළ මාධ්‍ය සංසදයන් මගිනි. එසේම කොටින්ගේ පොංගු තමිල් සංදර්ශන කොළඹ හා දකුණේ පළාත්වල සංවිධානය කරන්නට ආධාර කළේද කොළඹ වෙසෙන කොටි හිතවාදී සිංහළයින් ය. එසේම හමුදාවට කොටි පරාජය කළ නොහැකියයි දුර්මත ජනතාව අතර වැපිරවූයේද ඔව්හු වෙති.

කොටි සංවිධානය **දේදුන්න** නමින් වර්ණවත් සිංහළ ටැබ්ලොයිඩ් ප්‍රමාණයේ පුවත්පතක් මුද්‍රණය කර ශ්‍රීලංකාවේ බෙදාහැරියාය. නිවැරදි ව්‍යාකරණ සහිතව සාරවත් භාෂාවෙන් ලියන ලද එහි අඩංගු ලිපි අතර කොටිනායක ප්‍රභාකරන්ගෙන් සිංහළ ජනතාවට ලියන ලද විවෘත ලිපිද නිතර එහි පළවීය. එම දේදුන්න පුවත් පත සිංහළ බස හොඳින් ප්‍රගුණ කළ දෙමළ විද්වතුන් විසින් සංස්කරණය කරනු ලබන්නකැයි මුලින් බොහෝ දෙනා සිතා සිටියත් එය එසේ නොව සිංහළ මාධ්‍යවේදීන් විසින් කොටි සංවිධානය සඳහා නිර්මාණය කරන්නක් බව පසුව හෙළිවීය. නොබෝ කලකින්ම කොළඹ සහ අවට විසූ සිංහළ තරුණ මාධ්‍ය කණ්ඩායමක් කොටි සංවිධානය සමග සමීප සම්බන්ධතා පවත්වා ඇතිවා පමණක් නොව ඔවුන් මුලතිව් කලෑවටද ගොස් කොටින්ගෙන් සටන් පුහුණුව හා බෝම්බ අටවන හැටිද උගත් බවද එම පෙලීසියට හසු වූ එම ද්‍රෝහී සිංහලයෝම පැවසූහ. මේ අනුව කොටි සමග සම්බන්ධතා පවත්වා ඇති සිංහළයින් තවත් සිටිනබව පැහැදිලිය. මගීන් රාශියක් ඝාතනය කරමින් පිලියන්දල පුපුරාගිය බස් බෝම්බය ඒ බසයේ තැන්පත් කළේ සිංහලයින් දෙදෙනෙකු බව ද සොයාගන්නට හැකි විය.

රජයේ හමුදාවන්හි හා පොලීසියේ ඇතැම් නිලධාරීන් කොටි සංවිධානය හා සම්බන්ධකම් පවත්වන බවටත් ඔවුන්ට ඔත්තු සපයන බවටත් වරින්වර එල්ලවූ චෝදනා ගැන සෝදිසි කර බැලූ විට ඒවා සත්‍ය බව මනාව වැටහිණ. මේ ළඟදී ද හමුදාවේ උසස් නිලධාරියෙක් මරාගෙන මැරෙන කොටියෙකුද රැගෙන ජනාධිපතිවරයා ඇතුළු උසස් පෙළේ අය ඝාතනය කිරීම සඳහා කොළඹ සැරිසරූ බවත්, හමුදාවේ මනා සෝදිසි පරීක්ෂාවන් නිසා එම තැත ව්‍යවර්ථව ගිය බවත් එම ද්‍රෝහී නිලධාරියා පිළිගෙන ඇත. ඔහුට විශාල මුදල් ප්‍රමාණයන් එල්ටීටීඊය ගෙවා ඇති බවද ඔහු පිළිගත්තේය.

මේ අනුව කොටින්ගෙන් ලැබෙන මුදල් හා වෙනත් වාසි තකා තම උපන් මව්බිමද සහෝදර ජනතාවද විනාශ කරන්නට දායකවූ සිංහළ ද්‍රෝහීන්ගේ ගණන සුළුපටු නොවේ. අසූ නොවූ සංඛ්‍යාව තව කොතෙක් ඇත්දැයි අපට සිතා ගත හැකිය.

කොටින්ගේ ඊළම් රාජ්‍යය සැබෑවක් කරන්නට දායක වූ සිංහළ කලාකරුවෝ, දේශපාලකයෝ, සාම වෙළෙන්දෝ සහ මහාචාර්යවරුද වෙති. විශ්වවිද්‍යාලයක සිංහළ මහාචාර්යවරයා ලෙස පත්ව සිටි එක් සිංහළයෙක් ද්‍රවිඩ ඊළාමයට ප්‍රශස්ති ගීතයක්ද ලියුවේය. එම ගීය මෙහි පළවේ. එයට තනුව යොදා සංගීතය නිර්මාණය කළේද සිංහළයෙකි. ගායනා කළේද සිංහළයෙකි. එම ගීතයේ වචන පෙළ කියවා බැලූවිට සිංහළයෙකැයි අප සිතන මෙම මහාචාර්යවරයා කොපමණ නීච ද්‍රෝහියෙක් දැයි මනාව වැටහේ.

“ සිංහළ හමුදාවට උතුරෙන් පහර දෙන විට දකුණේ අපිත් ඒ හමුදාවට ගසා කොන්ද කඩා උන් බාවන්නෙමු ” යයි මේ තුච්ඡ මහාචාරියාගේ ගීතයේ කියැවෙයි. මෙවැනි සිහළයින් අප රටට මහා ශාපයක් නොවේද?

ඊළම් නමැති සිහින රාජ්‍යය නුදුරු අනාගතයේ ශ්‍රීලංකාව තුළ පිහිටුවන බව කොටි ත්‍රස්තවාදීහු ගිය මාසය වන තෙක් ස්ථිරවම කියා සිටියහ. ශ්‍රීලංකාවේ පමණක් කොව ලොව පුරා වෙසෙන මෝඩ දෙමළ ඩයස්පෝරාවද ඒ බව විශ්වාස කළේය. ශ්‍රීලංකාවේ සිටින මා ඉහතින් සඳහන් කළ දේශපාලකයෝ ඇතුළු කොටින්ට පක්ෂව ක්‍රියා කළ සියළුම සිංහළයෝද එලෙසම සිතූහ. කොටි බලයටවිත් උතුරු නැගෙණහිර ඊළම් රාජ්‍යයක් බිහිකළේ නම් ඉහත කී ද්‍රෝහීන්ට වර ප්‍රසාද හා මිලමුදල් යහමින් ලැබෙනවා ඇත. දේශප්‍රේමයක් නැති උන්ට රට කුමන සතුරෙකු අතට ගියත් තමන්ට හොද්ද බොරවෙනවා නම් ඉන් කමක් නැත. පසුතැවිල්ලක් නැත.

එහෙත් උන් හැමගේත්, කොටියන්ගේත් සිහින හා බලාපොරොත්තු සුන්කරමින් ස්ථිරසාර වර්තමාන ශ්‍රීලංකා රජයද, ධීර ගුණයෙන් හා අභීතකමින් පිරිපුන් ශ්‍රීලංකා සන්නද්ධ සේනාංකද එකතුව කොටි හමුදාව සුන්නද් ධූලිකර දැමූහ. එසේ නොවන්නට ශ්‍රීලංකාව හා සිංහළයා වචනයෙන් කිව නොහැකි අති භයංකාර විනාශයකට ගොදුරු වෙනවා ඒකාන්තය. කොටි සතුව තිබූ ආයුධ ඊට සාක්ෂිය.

අප මින් ඉහත හඳුනාගෙන නොසිටි ද්‍රෝහීන් මේ යුද්ධයෙන් පසු හඳුනාගැන්මට අපට හැකවිය. ද්‍රෝහියා යනු හොඳ නරක ගුණ අගුණ කියා දී පුනරුත්ථාපනය කළ හැකි එකෙක් නොවේ. උන් අප සමාජයටම පිළිල යකි. තමන්ගේ රට වනසන්නට සතුරාට එකතු වන එකා ආපසු හොඳ මිනිහෙක් ලෙස ගණන් ගන්නේ කෙසේද? උන් හා ඇයි හොඳයිකම් පැවැත්වීම නොව උන් වසංගත රෝගයක් සේ සලකා නිසැකව දුරින්ම දුරු කළ යුතු ය.

♦ **විස්කම් සෙනෙවිරත්න**
යක්කල Sri Lanka




## මෙන්න සිංහළයෙකු ලියූ ඊළාම් විමුක්ති සිංහළ ගීතය

***මේ ගීතය ලියා ඇත්තේ 1996 දීය.***

ඊල විමුක්ති ද්‍රවිඩ ජාති විමුක්ති
දින දින බල පා අධිබල ශක්ති

ඊළාම් දේශාම්බරයේ නැග එන
රිවි බිම්බා සේ රුපුනොද තම්බා
බැඳ තෙද දිය දද දියත කලම්බා

සව්බල අව්බල අරගලයෙන් නිති
නැති බල මහජාතික අදිරද ගති
ධනපතිකම සින්දා
කිතු මුතුහර දිගඹුන් ගෙල බන්දා
යස සඳුනින් ඇගෙ උරතල අන්දා

ස්වයං තීරණේ අයිතිය රකිනෙමු
නැත කිසි කොන්දේසි
මහ සිංහළ ධනපති හමුදා
එන ඔබ බල බිඳලන්ටා
ගසනෙමු දකුණු දෙසින් නිර්ධන අපි
බිඳෙන ලෙසා උන්ගේ පිටකොඳු ඇට
නැගනහිරෙන් හා උතුරෙන් ගසනුය
බාවන්නෙමු දකුණේ
මාක්ස් ගිය මග ලෙනින් ගිය මග
ට්‍රොට්ස්කි ගිය මගෙහි

වෙනත් මං නැත අතර මං මිස
ජාත්‍යන්තරේ තුන්වන තීරනේ පිහිටා
ස්වයං තීරණේ අයිතිය රකිනෙමු
නැත කිසි කොන්දේසි

**රචනය - මහාචාර්ය සුචරිත ගම්ලත්**
**සංගීතය - මාෂල් ජනතා**
**ගායනය - ගීතානන්ද ජයසේකර**

*මෙය උතුරේ LTTE පොංගු තමිල් වේදිකාවල වාදනය වූ බව කියති.*